# බෞද්ධ සාහිත්‍යයේ එන දෙව් දේවතාවෝ

ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක

කඳපොළ මේධානන්ද හිමි

බෞද්ධ සමය සම්බන්ධයෙන් දෙවියන් ගැන කථා කිරීම න්‍යාය විරෝධී සේ පෙනෙනුයේ සර්වබලධාරී සදාකාලික දෙවියකුගේ පැවැත්ම බුදුදහමෙහි නොපිළිගැනෙන හෙයිනි. එහෙත් බෞද්ධ සාහිත්‍යානුගත දෙවියන් සහ සෙසු සමය වාදීන්ගේ දෙවියනුත් අතර ප්‍රධාන වශයෙන් විශාල වෙනසක් දක්නට ඇත. එයට හේතුව බෞද්ධ දෙවියන් අජරාමර නොවන හෙයිනි. ඔවුනට දීර්ඝ ආයුකාලයක් ඇතත් සෙසු සියලු ජීවීන් හා භෞතික වස්තූන් මෙන් විපරිණාමයට ගොදුරු වෙති. නියාමයනට හා කර්ම චක්‍රයේ පාලනයට භාජනය වෙති. ආයුෂයාගේ අවසානයේදී ඔවුන් මිය යා යුතුය. කුසලාකුසල ඵල ද විඳිය යුතුය. පුනර්භවයට භාජනය විය යුතුය. එහෙයින් දේවත්වය ද සසර සැරිසරන එක්තරා ජන්මාංගයකි.

සූත්‍රපිටකයෙහි දෙවියන් හා බඹුන් ද ගාන්ධර්ව, අසුර, යක්ෂ, කුම්භාණ්ඩ, නාග ආදී නොයෙක් තලාවූ, බුමාවූ අමනුෂ්‍ය නිකායන් ගැන සඳහන් වේ. මොවුහු විවිධ ප්‍රමාණයේ උත්තරි මනුෂ්‍ය බලයෙන් යුක්තවෙති.

බ්‍රහ්මයන් අතර අග්‍රගණ්‍යවූ සහම්පති මහාබ්‍රහ්මයාට එක ඇඟිල්ලක් එසවීමෙන් දස දහසක් සක්වළවල් හෙළි කළ හැකි බව කිය වේ.

දෙදෙව් ලොවට අධිපති ශක්‍ර දෙවියන්ට ශක්තිමත් පුරුෂයකු නැමූ හස්තයක් දිගු කිරීමට මත්තෙන් තමන් කැමති තැනෙක කුමන හෝ වේශයකින් යා හැකි බව පැවසේ.

බුදුරදුන් ධරමානකාලයෙහි එතුමන්ට වඩා බල සම්පන්නයැයි සිතූ දෙවියන් ගැනද බෞද්ධ පොත පතෙහි දක්නට ලැබේ.[1] බ්‍රහ්ම නිමන්තනික සූත්‍රයෙහි එන බක බ්‍රහ්මයාගේ කථා පුවත එයට කදිම නිදසුනකි. ඔහුගේ විමානයෙහිදීම ඔහුගේ බලය බිඳ දැමීමෙන් බුදුන් ඔහු මර්දනය කළ ආකාරය පැහැදිලි වේ.

ඍද්ධි බලයෙන් අගතැන්පත් මහාමෞද්ගල්‍යායන මහරහතන් වහන්සේ ශක්‍ර භවනයට වැඩි අවස්ථාවකදී ඍද්ධි බලයෙන් වෛජයන්ත ප්‍රාසාදය සොලවා සක් දෙවිඳු ඇතුළු පිරිස ශීර්ෂයේ සිට පාදන්තය දක්වා වෙවුල්වූ ආකාරය පිළිබඳ මනහර කථා පුවතක් ද ඇත.[2] ගුරුළුගෝමීන්ගේ අමාවතුරෙහි මේ ගැන සූත්‍රානුසාරයෙන් විසිතුරු විස්තරයක් කර ඇත.

1. චාතුර්මහාරාජිකය
2. තාවතිංසය
3. යාමය
4. තුසිතය
5. නිර්මාණ රතිය
6. පරනිර්මිත වසවර්තිය.

යනු සදෙව්ලොවයි.

1. මෙහි පහත ම දිව්‍යලෝකය වශයෙන් චාතුර්මහාරාජිකය ගැනේ. සතර වරම් දෙවිවරු මෙහි වසති.

(1) ධෘතරාෂ්ට්‍ර — නැගෙනහිර
(2) විරූළ්හක — දකුණු දිග
(3) විරූපාක්ෂ — බටහිර දිග
(4) වෛශ්‍රවණ — උතුරු දිග

මෙම දිසාවන් හතරට මෙම දෙවිවරු අධිපති කම් කරති.

[3]. පුරත්ථිමෙන ධතරට්ඨො
දක්ඛිණෙන විරූළ්හකො
පච්ඡිමෙන විරූපක්ඛො
කුවෙරොඋත්තරං දිසං

(දී.නි. මහාසමය සුත්ත)

2. චාතුර්මහාරාජිකය අසලින්ම එයට ඉහළින් තාවතිංසය පිහිටා ඇත. චාතුර් මහාරාජිකය, තාවතිංසය යන දෙදෙව්ලොවට අධිපති[4] සක් දෙවරජුගේ වාසස්ථානය මෙහිය. ඔහුගේ වාස භවනය වෛජයන්ත ප්‍රාසාද නමින් හැඳින්වේ. දිව්‍ය සභාව සුධර්මා නමින් හඳුන්වති. මගුල් උයන චිත්‍රලතා නමින්ද මගුල් පොකුණ නන්‍දා නමින්ද අග බිසෙව සුජාතා නමින්ද හැඳින්වෙති. සිංහාසනය පණ්ඩු කම්බල ශෛලාසනය නමින් යුත් ගල් අසුනකි. ප්‍රධාන දිව්‍ය සභිකයින් තිස් දෙනෙක් ගැන සඳහන්වේ. බෞද්ධ සාහිත්‍යයෙහි සක් දෙවිඳු තරම් සුපතළ තවත් දෙවි කෙනෙක් නොමැත. මැදුම් සඟියෙහි චූලතණ්හාසංඛය සූත්‍රයෙහි නිවන් අරමුණු කොට රහත්වූ දෙව්මිනිසුනට උතුම් මහණහුගේ පූර්වභාග ප්‍රතිපත්ති සැකෙවින් මට වදරනු මැනව' යි කී කල්හි බුදුන් "ඉධ දෙවානමින්ද භික්ඛුනො සුතං හොති" යනාදි වශයෙන් පැන විසඳූසේක. මේ නයින් බෞද්ධ සාහිත්‍යයේ දෙවියන් අතර ශ්‍රේෂ්ඨත්වය මොහුට හිමිවේ.

3. තාවතිංසයට අනතුරුව ඊට ඉහළින් ඇත්තේ යාමයයි. මෙය යාම දෙවිවරු වාසය කරන දෙව්ලොවයි. ප්‍රසිද්ධ වෘක්ෂ හා ගෘහ දෙවතාවෝ බූමාටු දේව ගණයට අයත්ය.

සත්ත සහස්සා යක්ඛා–භුම්මා කාපිලවත්ථවා–කපිල වස්තු පුරයෙහි වැසි බූමාටු දෙවියෝ සත් දහසක් පැමිණියහ. ඔවුහු යහපත් වර්ණ ඇත්තෝය. යස පිරිවර ඇත්තෝයයි මහාසමය සූත්‍රයේ විස්තරවේ. වන ග්‍රාම නගර රාජභවන උද්‍යාන සුසානභූමි ආදියට අධිගෘහිත දෙවියෝද දිව්‍යාත්මභාව ලැබූ කොටස් වශයෙන් සැලකෙත්.

දෙවියන්ට වඩා පහත් එහෙත් දිව්‍ය ආත්ම වශයෙන් සැලකෙන යක්ෂ කොටස් ද වෙති. අට විසි යක් සෙනෙවියන් මොවුනතර ප්‍රධානය. බ්‍රහ්මයන්ගෙන් පහත දේව නිකායවල වූවෝ යක්ෂ නාමයෙන්ද විස්තර වෙති. ශක්‍රයාට පවා මේ නම ව්‍යවහාර වූ අවස්ථා ඇත. රාග, ද්වේෂ, මෝහ යන අකුශලයන්ගෙන් නොමිදුණු නිසා ඔවුහු හැම විටම ධාර්මික නොවෙති. එහෙත් මේ සැම දේව නිකායක්ම අධිගමය සඳහා හේතු සම්පත් ඇති හෙයින් භව්‍ය වන්නාහුය.

බුදුන්ගෙන් සක්ක පඤ්හ සූත්‍රය ඇසූ සක් දෙවිඳු සෝවාන් ඵලයට පත්වූයේය. අටවිසි යක් සෙනෙවියන් අතුරෙන් සාතාගිර හේමවත දෙදෙනා ප්‍රථම ධර්ම දේශනාව වූ දමසක් පැවැතුම් සූත්‍රය අසා සෝවාන් වූහ්වෝය. තථාගතයන් වහන්සේ මහියංගනයට වැඩි අවස්ථාවේ සමන් දෙවියන් උන්වහන්සේගෙන් බණ අසා සෝවාන් වූ බව පාරම්පරිකව මෙරට ඇදහෙන කරුණකි. එය මහාවංශයෙහි මහියංගන ගමන පිළිබඳ විස්තරයෙහි :

" සොතාපත්ති ඵලං පත්වා සෙලෙ සුමන කූටකෙ මහාසුමන දෙවින්දො පූජියං යාචි පූජියං " යනුවෙන් දැක්වේ.

සහම්පති මහබඹු

තථාගත චරිතය හා බැඳුනු වැදගත් සිද්ධීන්ට දෙවියන් සහ බ්‍රහ්මයන් බොහෝ සම්බන්ධවී ඇති බව පෙනේ. සිදුහත් කුමාරොත්පත්තියෙහිදී බ්‍රහ්ම රාජන් වූ මහා බ්‍රහ්ම ද දිව්‍ය රාජන් වූ ශක්‍රද බෝසතුන්ට උවටැන් සඳහා එහි පැමිණ සිටි බව කියැවේ. අභිනිෂ්ක්‍රමණය කළ බෝසතුන්හට පිරිකර පිළිගැන්වූයේ සහම්පති මහ බඹු විසින් බව සඳහන්වේ. මහ බෝමැඩදී සච්නෝ ගෙවා දැන

බුද්ධත්වයට පැමිණෙන විටද ශක්‍ර බ්‍රහ්ම ආදී සියලු දෙවියෝ එහි රැස්ව සිටියහ. ධර්ම දේශනා කිරීමට තථාගතයන් වහන්සේට ආරාධනා කළේ ද සහම්පතී බඹු විසින්ය. ඉසිපතන මිගදායේදී දම්සක් දෙසුම ශ්‍රවණය කිරීමට මිනිසුන් අතර සිටියේ පස්වග මහණුන් පමණය. සෙසු සියලු දෙන දිව්‍ය බ්‍රහ්ම යක්ෂ සේනාවෝය.

බුදුරජාණන් වහන්සේ පිරිණිවන් පා වදාරන අවස්ථාවේදී ද දෙවියෝ බ්‍රහ්මයෝ රැස්ව සිටියහ. වර්තමානයේද බෞද්ධ අවමඟුල්වලදී භාවිතා කරන

" අනිච්චා වත සංඛාරා
උප්පාද වය ධම්මිනො
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති
තෙසං වූපසමො සුඛො "

යන ගය ශක්‍ර දේවේන්ද්‍රයන් විසින් තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණ අවස්ථාවේ කියන ලදී. මෙයම දහම්සොඬ රජ කුමාටද ශක්‍රයා විසින් පැවසූ බව සඳහන්වේ.

**පරිනිබ්බාණ සූත්‍රය**

" යෙභුයෙ‍යන ආනන්ද දසසු ලොකධාතුසු දෙවතා සන්නිපතිතා තථාගතං දස්සනාය " ආදි වශයෙන් ආනන්ද බොහෝ සෙයින් දස දහසක් සක්වළ දෙවියෝ තථාගතයන් දැකීමට රැස්වූවෝය. මේ අයුරින් මෙම සූත්‍රයෙහිද දෙවියන් ගැන දිර්ඝ විස්තරයක් සඳහන් වේ. බුදුන් පිරිනිවන් පෑ මොහොතේ සංවේගය පළකිරීම සඳහා ඉදිරිපත් වූවන් අතර පළමුව සහම්පතී මහා බ්‍රහ්මයාත් දෙවනුව ශක්‍ර දේවේන්ද්‍රයාත් සඳහන් වේ. තෙවනුව සඳහන් වනුයේ රහත් නමක් වූ අනුරුද්ධ මහතෙරුන් වහන්සේය.

**මහා සමය සූත්‍රය**

දීඝ නිකායට ඇතුළත් මහාසමය සූත්‍රයෙහි දෙවියන් ගණන් වශයෙන් දිගු විස්තරයක් තිබේ.

**ආටානාටිය සූත්‍රය**

මෙම සූත්‍රයේ යක්ෂ කුම්භාණ්ඩ ගන්ධර්ව නාග ගෝත්‍රිකයන් ගැන විස්තර සඳහන් වේ. යක්ෂ පුරයක් වූ ආටානාටියේදී රචිත නිසා මෙයට මේ නම ව්‍යවහාර වූයේය. වරෙක රජගහ නුවර ගිජුකුළු පව්වෙහි වැඩ වසන බුදුන් වහන්සේ දැකීමට සතර වරම් දෙවිවරු පැමිණියහ. ඔවුනතුරෙන් වෙසවුණු මහරජු තථාගතයන් වහන්සේගෙන්,

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුණු මෙන්ම නොපැහැදුණු ද නීච උදාර මධ්‍යම නොයෙකුත් යක්ෂයෝද ගාන්ධර්වයෝද කුම්භාණ්ඩයෝද ඇත්තාහ. බොහෝ සෙයින් හිමියනි, ඔවුහු භාග්‍යවතුන් කෙරෙහි නොපැහැදුණු අය වෙති. එයට හේතුව භාග්‍යවතුන් වහන්සේ පස්පවින් වැලකී සිටීමට දහම් දෙසන සේක. එහෙත් ඔවුහු ඉන් නොමිඳුනාහ. එනිසා ස්වාමීනි, ඔබ වහන්සේගේ දහම ඔවුනට අප්‍රියය. එහෙයින් හිමියනි, අරණ්‍ය වනපත්ථ ප්‍රාන්ත සේනාසනාදියෙහි ධ්‍යාන වඩන ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ ආරක්ෂාව සඳහා ආටානාටිය සූත්‍රය ඔවුනට උගන්වන සේක්වා යි ඉල්ලා සිටියේය.

සතර වරම් දෙවිවරු ඉන් නික්ම ගිය පසු තථාගතයන් වහන්සේ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා පිරිසගේ රක්ෂාවරණ ගෝපනය සඳහා මෙම සූත්‍රය උද්ග්‍රහණ ධාරණයෙහි යෙදෙනසේ භික්ෂූන් වහන්සේලා මෙහෙය වූ සේක.

ශාන්තිනායකයාණන් වහන්සේ පිරිනිවන් මඤ්චකයෙහිදී සම්බුදු ශාසනය ආරක්ෂාකිරීම සඳහා සක් දෙවිඳුහට බාරකළහ. සක් දෙවිඳු විෂ්ණු දෙවියනට බාර කළ බව සඳහන් වේ. එහෙත් මේ ගැන නොයෙකුත් මතභේද ඇත. උප්පලවණ්ණ යන නමින් හැඳින්වෙන්නේ ද විෂ්ණු දෙවියන් බව විශ්වාසයේ පවතී.

පතිට්ඨිස්සති දෙවිඤ ලඞ්කායං මම සාසනං
තස්මා සපරිවාරංතං රක්ඛ ලඞ්කඤ්ච සාධුනා
තථාගතස්ස දෙවින්දො වාචං සුත්වාන සාදරො
දෙවඤ්සුප්පලවණ්ණස්ස ලඞ්කාරක්ඛං සමප්පයි.

මෙසේ මහාවංශයේ විස්තර වෙන ආකාරය විමසීම වටී. බෞද්ධ සාහිත්‍යයේ දැක්වෙන පරිදි යාමයට ඉහළින් ඇත්තේ තුසිතයයි. පෙරුම් පුරණ බෝසත්වරුන් පෙරුම් දම් පුරා නිමකොට බුදු වන තුරු වාසය කරන තැන මෙය බවද පෙනේ. බෝසත්තුමා මෙහි ඉපිද සිටි අවස්ථාවේ දෙවිවරු බුද්ධත්වය සඳහා මනු ලොව ඉපදීමට කාලය බැව්—

"කාලොයං තෙ මහාවීර උප්පජ්ජ මාතුකුච්ඡියං
සදෙවකං තාරයන්තො බුජ්ඣස්සු අමතං පදං "යී

දැක්වූ බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. මෙය විශේෂ සිද්ධියෙකි.

තුසිතයට ඉහළින් පිහිටා ඇත්තේ නිර්මාණරතියයි. මෙහි තම තමන් විසින් නොයෙක් රූප මවා ගෙන සතුටු වෙන දෙවිවරු වෙසෙති.

පරනිර්මිත වසවර්තිය නිම්මානරතියට ඉහළින් පිහිටා ඇත. මෙහි වසන දෙවියන් අනුන් මවන දෙවියන් දක වසඟ වෙමින් සතුටු වන බව සඳහන්වේ. මෙහිම වසවර්ති මාරයා එක්කොට සක වාසය කරන බව අටුවාවෙහි විස්තර වේ. කාමලෝකයන්ගෙන් ඉතා උසස් ස්ථානයද මෙම දෙව්ලොව බව සඳහන් වේ. පඤ්ච කාමයන්ට ගෝචරවූ මෙම දිව්‍යලෝක සය කාමාවචර දිව්‍ය ලෝක යනුවෙන් හැඳින් වේ.

මෙයට ඉහළින් පිහිටා ඇත්තේ රූපාවචර ලෝකය වන බ්‍රහ්ම ලෝකයයි. ධ්‍යාන ලාභීන් උපදනා මේ ලෝකවල ඉන්ද්‍රියයන් සතුටු කිරීමක් නොමැත. පඤ්චකාම සම්පත්තියක්ද නැත. ගණනින් සොළසක් වූ මේ රූපාවචර ලෝකවල ඉහළම තලය අකණිට්ඨක බ්‍රහ්ම ලෝකයයි. ශුද්ධාවාස නමින් ගැනෙන අනාගාමී රහත් බඹුන් වෙසෙන බ්‍රහ්ම ලෝක පසද මෙයට අයත් වේ.

**බුමාටු දෙවිවරු**

තමන්ටම ආවේණික වූ ලෝකයන් සහිත ඉහත කී දේවකායයන් හැරුනු විට තවත් ගිණිය නොහැකි තලාටු බුමාටු දෙවියෝද වෙනත් නොයෙකුත් අමනුෂ්‍ය නිකායයෝද ඇත.


ඇසුරුකළ පොත්

- මජ්ඣිම නිකාය.
- අමාවතුර
- දීඝනිකාය
- Sakk—Dictionary of Pali Proper Names—Vol. II
- මහාවංසය


---

* යො නිඃසෘතශ්ච නච නිඃසෘතකාමරාගඃ
කාෂායමුද්වහති යො න ච නිෂ්කෂායඃ
පාත්‍රං බිභර්ති ච ගුණෛර් න ච පාත්‍රභූතො
ලිඞ්ගං වහන්නපි ස නෛව ගෘහී න භික්ෂුඃ

යමෙක් ගිහිගෙන් නික්මුණේ නමුදු කාමරාගයෙන් නික්මුණේ නොවේද කාෂාය වස්ත්‍රයක් දරන නමුදු ඊර්ෂ්‍යා ක්‍රෝධාදී කසට ගති සිතින් බැහැර නොකළේද පාත්‍රයක් දරන නමුදු සද්ගුණයන්ගෙන් මෙරමාගේ ගෞරවයට හා ප්‍රසාදයට පාත්‍ර නොවූයේද හේ පැවිදි ලක්ෂණ දරන නමුදු ගිහියෙක්ද නොවේ. පැවිද්දෙක්ද නොවේ.

(සෞන්දරනන්ද කාව්‍යය)

---